# වී වගාව සඳහා පොහොර නිර්දේශය - 2013

ඩී.එන්. සිරිසේන

වී පර්යේෂණ හා සංවර්ධන ආයතනය
බතලගොඩ, ඉබ්බාගමුව
2013.05.10

**තාක්ෂණය**

ඩී. එන්. සිරිසේන

පාංශු විද්‍යාඥ

වී පර්යේෂණ හා සංවර්ධන ආයතනය

බතලගොඩ, ඉබ්බාගමුව

**සිතියම් සැකසීම හා පිටපත් කියවීම**

ඩබ්. එම්. යූ. කේ. රත්නායක

පර්යේෂණ නිළධාරී

වී පර්යේෂණ හා සංවර්ධන ආයතනය

බතලගොඩ, ඉබ්බාගමුව

**පිටකවරය හා පිටු සැකසීම**

ගයානි දිල්රුක්ෂි ඊරියගම

ශෂිකලා උදේශිනි කුරුප්පුආරච්චි

කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

ශ්‍රව්‍ය දෘෂ්‍ය මධ්‍යස්ථානය, ගන්නොරුව

**තාක්ෂණික සහාය**

ඩබ්.ආර්.ඒ.ටී.පී. විජේසුන්දර

පර්යේෂණ සහකාර

NARP ව්‍යාපෘතිය

**මුද්‍රණය**

මුද්‍රණාලය

කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

පේරාදෙණිය

**ප්‍රකාශක**

කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල්

කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

**අනුග්‍රහය**

ජාතික කෘෂිකර්ම පර්යේෂණ වැඩසටහන

ශ්‍රී ලංකාවේ කෘෂිකර්ම පර්යේෂණ ප්‍රතිපත්ති සභාව

# පටුන


| අංකය | | පිටු අංක |
|---|---|---|
| 01. | වී වගාව සඳහා පෝෂක අවශ්‍යතාවය හා පොහොර නිර්දේශ කිරීම | 01 |
| 02. | 2001 වසරේ වී වගාව සඳහා පොහොර නිර්දේශය | 02 |
| 03. | 2001 වසරේ වී වගාවේ පොහොර නිර්දේශයේ සමාලෝචනය | 03 |
| 04. | 2001 පොහොර නිර්දේශය වෙනස් කිරීම සඳහා සාකච්ඡාවට භාජනය කළ විශේෂිත කරුණු | 04 |
| 05 | 2013 පොහොර නිර්දේශයේ නයිට්‍රජන්, පොස්පරස් හා පොටෑසියම් පොහොර භාවිතය සඳහා කර ඇති වෙනස්කම් | 09 |
| 06. | 2013 පොහොර නිර්දේශයේ සින්ක් පොහොර භාවිතය | 10 |
| 07. | 2013 පොහොර නිර්දේශයේ කාබනික ද්‍රව්‍ය භාවිතය | 10 |
| 08. | 2013 පොහොර නිර්දේශයේ ඇති රසායනික පොහොර වර්ග | 11 |
| 09. | පොහොර නිර්දේශ සඳහා ප්‍රදේශ වෙන්කර හඳුනා ගැනීම | 11 |
| 10. | පොහොර නිර්දේශය සකස් කිරීමේදී හඳුනාගත් කලාප | 11 |
| | 10.1 වියලි හා අතරමැදි කලාප සඳහා ජල සම්පාදිත තත්ත්ව යටතේ වී වගාවට අවශ්‍ය පෝෂක ප්‍රමාණ හා පොහොර නිර්දේශය | 15 |
| | 10.2 වියලි හා අතරමැදි කලාප සඳහා වර්ෂා ජලයෙන් පමණක් වී වගා කරන විට වී වගාවට අවශ්‍ය පෝෂක ප්‍රමාණ හා පොහොර නිර්දේශය | 17 |
| | 10.3 තෙත් කලාපයේ ජල සම්පාදිත තත්ත්ව යටතේ වී වගාවට අවශ්‍ය පෝෂක ප්‍රමාණ හා පොහොර නිර්දේශය | 18 |
| | 10.4 තෙත් කලාපය සඳහා වර්ෂා පෝෂිත තත්ත්ව යටතේ වී වගාවට අවශ්‍ය පෝෂක ප්‍රමාණ හා පොහොර නිර්දේශය | 20 |
| 11. | පොහොර භාවිතය තවදුරටත් කාර්යක්ෂම කිරීමට හා වැඩි අස්වැන්නක් සඳහා ගොවි ජනතාවට උපදෙස් | 22 |
| 12. | වී වගාව සඳහා පොහොර නිර්දේශ කිරීමට කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල් විසින් පත් කරන ලද කමිටුව | 23 |
| | ස්තූතිය | 24 |

# වගු


පිටු අංකය

| | | |
|---|---|---|
| වගුව 1 | වී වගාවේ ධාන්‍ය අස්වැන්න හෙක්ටයාර් එකකට ටොන් එකක් ලබා ගන්නා අවස්ථාවේදී පසෙන් ඉවත් වන පෝෂක ප්‍රමාණ | 01 |
| වගුව 2 | පත්‍ර වර්ණ දර්ශකයට අනුව හා සාමාන්‍ය ක්‍රමයට අනුව නයිට්‍රජන් පොහොර භාවිතා කිරීමේදී අවශ්‍ය වන නයිට්‍රජන් ප්‍රමාණ | 09 |
| වගුව 3 | පොහොර නිර්දේශ සකස් කිරීමේදී වියලි, අතරමැදි හා තෙත් කලාපවලට අයත් වන ලෙස වෙන් කරන ලද දිස්ත්‍රික්ක හා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ | 13 |
| වගුව 4 | වියලි හා අතරමැදි කලාපවල ජල සම්පාදිත තත්ත්ව යටතේ වී වගා කිරීමේදී නිර්දේශිත පෝෂක ප්‍රමාණයන් | 15 |
| වගුව 5 | වියලි හා අතරමැදි කලාපවල ජල සම්පාදිත තත්ත්ව යටතේ වී වගා කිරීමේදී විවිධ වයස් කාණ්ඩවල වී වර්ග සඳහා ලබා දිය යුතු පොහොර ප්‍රමාණයන් හා කාලසීමාවන් | 16 |
| වගුව 6 | වියලි හා අතරමැදි කලාපවල වර්ෂා ජලයෙන් පමණක් වී වගා කිරීමේදී නිර්දේශිත පෝෂක ප්‍රමාණයන් | 17 |
| වගුව 7 | වියලි හා අතරමැදි කලාපවල වර්ෂා ජලයෙන් පමණක් වී වගා කිරීමේදී විවිධ වයස් කාණ්ඩවල වී වර්ග සඳහා ලබාදිය යුතු පොහොර ප්‍රමාණයන් හා කාලසීමාවන් | 17 |
| වගුව 8 | තෙත් කලාපය සඳහා ජල සම්පාදිත තත්ත්ව යටතේ වී වගා කිරීමේදී නිර්දේශිත පෝෂක ප්‍රමාණයන් | 18 |
| වගුව 9 | තෙත් කලාපය සඳහා ජල සම්පාදිත තත්ත්ව යටතේ වී වගා කිරීමේදී විවිධ වයස් කාණ්ඩවල වී වර්ග සඳහා ලබාදිය යුතු පොහොර ප්‍රමාණයන් හා කාල සීමාවන් | 19 |
| වගුව 10 | තෙත් කලාපයේ වර්ෂා ජලයෙන් පමණක් වී වගා කිරීමේදී නිර්දේශිත පෝෂක ප්‍රමාණයන් | 19 |
| වගුව 11 | තෙත් කලාපයේ වර්ෂා පෝෂිත තත්ත්ව යටතේ වී වගා කිරීමේදී විවිධ වයස් කාණ්ඩවල වී වර්ගවලට ලබා දිය යුතු පොහොර ප්‍රමාණයන් හා කාල සීමාවන් | 21 |

# රූප සටහන්


| | | |
|---|---|---|
| | | පිටු අංකය |
| රූපය 1 | වාරි පෝෂිත තත්ත්ව යටතේ මහ කන්නයේ වී අස්වැන්න (හෙක්ටයාර එකකට ටොන්) | 08 |
| රූපය 2 | වාරි පෝෂිත තත්ත්ව යටතේ යල කන්නයේ වී අස්වැන්න (හෙක්ටයාර එකකට ටොන්) | 08 |
| රූපය 3 | වර්ෂා පෝෂිත තත්ත්ව යටතේ මහ කන්නයේ වී අස්වැන්න (හෙක්ටයාර එකකට ටොන්) | 08 |
| රූපය 4 | වර්ෂා පෝෂිත තත්ත්ව යටතේ යල කන්නයේ වී අස්වැන්න (හෙක්ටයාර එකකට ටොන්) | 08 |
| රූපය 5 | තෙත් කලාපයට අයත් දිස්ත්‍රික්කවල අතරමැදි හා වියලි කලාපයට අයත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ | 14 |

# පෙරවදන

මීට දශක හයකට පෙර මිලියන හයක්ව පැවති ශ්‍රී ලංකාවේ ජනගහනය මේ වන විට මිලියන විස්ස ඉක්මවා ගොස් ඇති අතර වැඩිවන ජනගහනයට අවශ්‍ය ආහාර සැපයීම එදා සිට අද දක්වා අප හමුවේ පවතින ප්‍රධාන අභියෝග යකි. මෙම අභියෝගය ජය ගැනීම සඳහා වගා කරන ඉඩම් ප්‍රමාණය වැඩි කිරීමත්, වැඩි අස්වනු දෙන, ලෙඩ රෝගවලට ප්‍රතිරෝධී හා ප්‍රධාන වශයෙන් පවතින පාංශු ගැටළුවලට යෝග්‍ය වී වර්ග හඳුන්වා දීමත් දශක ගණනාවක සිටම අප විසින් සිදු කරනු ලබයි. වගා කරන ඉඩම් ප්‍රමාණය සීමා වීමත් නව වී වර්ගවලින් ලබා ගත හැකි අස්වැන්න උපරිමයට ලඟාවීමත් සමඟම තවදුරටත් වී අස්වැන්න වැඩි කිරීමේ ඉතාමත් භාරදූර කාර්යයට අපි දැන් අතගසා සිටිමු. මෙම වී අස්වනු තවදුරටත් වැඩි කිරීම සඳහා ඒකක බිම් ප්‍රමාණයකින් ලබා ගන්නා අස්වැන්න වැඩි කිරීමට ඉතාමත් සුදුසු නවීන ක්‍රමවේදයන් මෙන්ම පාරම්පරික ක්‍රමවේදයන් කෙරෙහි අපි දැන් අවධානය යොමු කරමින් සිටිමු.

1960 ගණන්වල සිට අස්වැන්න ඉහල නැංවීමේ ක්‍රියාවලිය යටතේ වී වගාවන් සඳහා රසායනික පොහොර යෙදීම ආරම්භ කරන ලද අතර විවිධ අවස්ථාවලදී යෙදිය යුතු පොහොර ප්‍රමාණයන් හා කාල වකවානු අඩංගු පොහොර නිර්දේශයන් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් ලබාදී ඇත. වසරින් වසර විවිධ වෙනස්කම්වලට භාජනය වෙමින් අවසාන වශයෙන් 2001 වසරේ පොහොර නිර්දේශය ලබාදෙන විට උපරිම අස්වැන්නක් ලබා ගැනීම සඳහා කිසිම ප්‍රධාන පෝෂකයක හිඟතාවයක් නොතිබෙන්නට වග බලා ගනිමින් පොහොර නිර්දේශය ඉදිරිපත් කර ඇත. 2001 වසරේ ලබා දුන් පොහොර නිර්දේශය වසර 12 ක් තිස්සේ ගොවීන් විවිධ පාංශු තත්ත්ව යටතේ භාවිතා කළ අතර දැනට එමගින් ලබා දෙන පොහොර කාර්යක්ෂමව භාවිතා නොවන බවට වාර්තා වී ඇත. පොහොර අපතේ යන ප්‍රමාණය වැඩි වීමෙන් සිදුවන පරිසර හානිය හා දිනෙන් දින ඉහළ යන පොහොර මිල සලකා බලන විට පොහොර භාවිතය කාර්යක්ෂම කිරීම මගින් උපරිම අස්වැන්නක් ලබා ගැනීම අද ඉතාමත් අත්‍යාවශ්‍ය කරුණක් වී ඇත. කාර්යක්ෂමතාවය වැඩිකර අවම පොහොර ප්‍රමාණයකින් පරිසර හිතකාමී ලෙස උපරිම අස්වැන්නක් ලබා ගැනීමේ ක්‍රමවේදයන් හඳුන්වාදීම දැන් සිදුකළ යුතුව ඇත. ශාකයේ අවශ්‍යතාවය අනුව යෙදිය යුතු පොහොර ප්‍රමාණ හා නියමිත කාලය තීරණය කිරීම මෙහිදී ඉතා යෝග්‍ය ක්‍රමයයි.

2001 සිට මේ දක්වා වී පර්යේෂණ හා සංවර්ධන ආයතනයට අනුබද්ධ සියලුම ආයතනවල පොහොර භාවිත කාර්යක්ෂමතාව වැඩි කිරීම පිළිබඳව කරන ලද පර්යේෂණයන්හි ප්‍රතිඵල සමාලෝචනය කරමින් ද, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ

ව්‍යාප්ති අංශය හා ගොවි ජනතාවගෙන් ලද කරුණු උපයෝගී කරගනිමින් ද, පොහොර මිල ගණන් හා පොහොර භාවිතය නිසා සිදුවන පරිසර දූෂණය පිළිබඳව නවතම දත්තයන් විශ්ලේෂණය කරමින් ද, 2001 පොහොර නිර්දේශය භාවිතා කරමින් ගොවීන් ලබා ගන්නා අස්වැන්න පිළිබඳ අවධානය යොමු කරමින් ද, පොහොරවලින් උපරිම කාර්යක්ෂමතාවක් ලබා ගත හැකි අයුරින් 2013 දී වී වගාව සඳහා නව පොහොර නිර්දේශයක් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් ඉදිරිපත් කර ඇත.

මෙම පොහොර නිර්දේශයේ අඩංගු කරුණු සමාලෝචනය කරමින් ජාතික කෘෂිකර්ම පර්යේෂණ වැඩ සටහනේ අනුග්‍රහය ඇතිව වී පර්යේෂණ හා සංවර්ධන ආයතනයේ පාංශු විද්‍යාඥ ඩී. එන්. සිරිසේන මහතා විසින් ලියා කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් පල කිරීමට යෙදුණ වී වගාවේ පොහොර නිර්දේශය 2013 නැමැති මෙම පොත් පිංච ඉතාමත්ම කාලෝචිත ප්‍රකාශනයකි.

පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ කෘෂිකර්මය පිළිබඳ ගෞරව උපාධිය ලබා ඇති ඩී.එන්. සිරිසේන මහතා මහා බ්‍රිතාන්‍යයේ ඇබර්ඩීන් විශ්වවිද්‍යාලයෙන් පශ්චාත් උපාධියක් ලබා ඇත. පාංශු විද්‍යාඥයකු ලෙස වසර 27 ක් දිවයින පුරා සේවය කිරීමෙන් ලද පලපුරුද්ද, දැනුම හා කුසලතාවය අනුව පොහොර භාවිතය පිළිබඳ ඔහුගේ පර්යේෂණාත්මක දැනුම පවා මෙම ග්‍රන්ථයට ඇතුලත් කිරීමට ඔහු උත්සාහ දරා ඇත. පාංශු විද්‍යාව හදාරන පාසල් සිසුන්ටත්, උසස් අධ්‍යාපනය හදාරන සිසුන්ටත්, විශේෂයෙන් වී වගාව පිළිබඳ උපදෙස් ලබා දෙන සියලු දෙනාටත් කාර්යක්ෂම පොහොර භාවිතයක් සහිතව වී වගාවකින් උපරිම අස්වැන්නක් ලබා ගන්නා අකාරය දැන ගැනීමට මෙම පොත් පිංචෙහි ඇති කරුණු උදව්වනු ඇති බව මගේ හැඟීමයි.

එස්.ඩබ්. අබේසේකර
අධ්‍යක්ෂ
වී පර්යේෂණ හා සංවර්ධන ආයතනය
බතලගොඩ
ඉබ්බාගමුව

# 1. වී වගාව සඳහා පෝෂක අවශ්‍යතාවය හා පොහොර නිර්දේශ කිරීම

ශ්‍රී ලංකාවේ වැඩි වශයෙන්ම වගාකරන නව වැඩි දියුණු කළ වී වර්ගවල විභව අස්වැන්න හෙක්ටයාර එකකට ටොන් 10 ක් පමණ වේ. මේ නිසා දිගින් දිගටම වැඩි අස්වනු දෙන වී වර්ග වගාකිරීමේදී විශාල වශයෙන් පෝෂක පසෙන් ඉවත්වේ. වී වගාවේ ධාන්‍ය අස්වැන්න හෙක්ටයාර එකකට ටොන් එකක් ලබාගන්නා අවස්ථාවේදී පෝෂක පසෙන් ඉවත්වන ප්‍රමාණ වගු අංක 1න් දැක්වෙයි. මෙම ඉවත් වන පෝෂක ප්‍රමාණයන් පසෙන්, ජලයෙන් හා වායුගෝලයෙන් ලබා ගැනීමට වී ශාක අසමත් වන විට අපට බලාපොරොත්තු වන අස්වැන්න ලබා ගත නොහැකි වේ. මෙයට පිළියමක් ලෙස පිටතින් පෝෂක ලබා දීමට සිදුවන අතර මේ සඳහා භාවිතා කලහැකි ප්‍රභවයන් පොහොර ලෙස හඳුන්වනු ලබයි. පෝෂක ලබා දෙන ප්‍රභව රසායනික හා කාබනික ලෙස වර්ග කල හැකිය. රසායනික පොහොරවල මිල ගණන් ඉතා අධික හෙයින් රසායනික පොහොර අවම මට්ටමකින් භාවිතා කොට උපරිම අස්වැන්නක් ලබා ගැනීම සඳහා පාංශු හෝ ශාක විශ්ලේෂණය මඟින් අවශ්‍ය පෝෂක වර්ග හා ප්‍රමාණයන් හඳුනාගෙන ඒවා නියමිත කාලයේදී ලබාදීම ඉතාමත් සුදුසු ක්‍රමය ලෙස හඳුනා ගෙන ඇත. නමුත් මෙය සෑම බිම් ඒකකයකටම සිදුකිරීම අපහසු බැවින් සමාන පරිසර තත්ත්ව යටතේ පවතින විශාල ප්‍රදේශයකට එකම රසායනික පොහොර ප්‍රමාණ නිර්දේශ කිරීම කලක සිට කරගෙන එනු ලබයි.

*වගුව 1. වී වගාවේ ධාන්‍ය අස්වැන්න හෙක්ටයාර එකකට ටොන් එකක් ලබා ගන්නා අවස්ථාවේදී පසෙන් ඉවත්වන පෝෂක ප්‍රමාණ*

| පෝෂකය | ප්‍රමාණය | |
|---|---|---|
| නයිට්‍රජන් | කිලෝ ග්‍රෑම් | 20 |
| පොස්පරස් | කිලෝ ග්‍රෑම් | 03 |
| පොටෑසියම් | කිලෝ ග්‍රෑම් | 17 |
| සල්ෆර් | කිලෝ ග්‍රෑම් | 02 |
| සිලිකන් | කිලෝ ග්‍රෑම් | 80 |
| මැග්නීසියම් | කිලෝ ග්‍රෑම් | 04 |
| කැල්සියම් | කිලෝ ග්‍රෑම් | 04 |
| යකඩ | ග්‍රෑම් | 500 |
| මැංගනීස් | ග්‍රෑම් | 400 |
| තුත්තනාගම් | ග්‍රෑම් | 50 |
| තඹ | ග්‍රෑම් | 12 |
| බෝරෝන් | ග්‍රෑම් | 15 |

කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ වී පර්යේෂණ හා සංවර්ධන ආයතනය මගින් 1960 ගණන්වල සිට කලින් කලට වී වගාව සඳහා භාවිතා කළයුතු පොහොර ප්‍රමාණ නිර්දේශ කරනු ලැබ ඇත. අවසාන වශයෙන් මෙසේ පොහොර නිර්දේශයක් ලබාදෙනු ලැබුවේ 2001 වසරේදීය.

## 2. 2001 වසරේ වී වගාව සඳහා පොහොර නිර්දේශය

වී වගාකරන කුඹුරුවලින් උපරිම අස්වැන්නක් ලබා ගැනීමේ අරමුණ ඇතිව 2001 වසරේ පොහොර නිර්දේශය හඳුන්වාදී ඇත. මෙහිදී අස්වැන්න උපරිම කරගැනීම සඳහා වියලි හා අතරමැදි කලාපයේ වාරි පෝෂිත හා වර්ෂා පෝෂිත තත්ත්ව යටතේ ලබා ගත හැකි අස්වැන්න හෙක්ටයාර එකකට ටොන් 5 - 7 ක් ලෙස සලකා ඇති අතර තෙත් කලාපයේ වැඩි විභවයක් ඇති ප්‍රදේශවල ලබා ගත හැකි අස්වැන්න හෙක්ටයාර එකට ටොන් 5 ක් ලෙස ද අඩු විභවයක් ඇති ප්‍රදේශවල අස්වැන්න හෙක්ටයාර එකකට ටොන් 4 ක් ලෙස ද සලකා වෙන් වෙන් වශයෙන් පොහොර නිර්දේශ ඉදිරිපත් කර ඇත.

යකඩ විෂවීම සහිත කුඹුරුවලට වැඩි පොටෑසියම් පොහොර ප්‍රමාණයක් ලැබෙන පරිදි ශ්‍රී ලංකාවේ සියලුම දිස්ත්‍රික්ක ආවරණය වන සේ පොහොර නිර්දේශ අටක් 2001 පොහොර නිර්දේශයට ඇතුලත්කර ඇත. මෙහිදී ප්‍රධාන වශයෙන් නයිට්‍රජන්, පොස්පරස් හා පොටෑසියම් පොහොර කෙරෙහි වැඩි අවධානයක් යොමුකර ඇති අතර ප්‍රධාන මූලද්‍රව්‍යයක් නොවුවත් සින්ක් හෙවත් තුත්තනාගම් කෙරෙහි ද විශේෂ අවධානයක් යොමුකර තිබේ. කාබනික ද්‍රව්‍ය යෙදීම අනිවාර්ය අංගයක් වූ මෙම පොහොර නිර්දේශයට නයිට්‍රජන් පොහොර ලෙස යූරියා ද පොස්පරස් පොහොර ලෙස සාන්ද්‍ර සුපර් පොස්පේට් ද පොටෑසියම් පොහොර ලෙස මියුරේට් ඔෆ් පොටෑස් ද සින්ක් පොහොර ලෙස සින්ක් සල්පේට් ද අඩංගු කර ඇත.

මෙම පොහොර නිර්දේශය ලබාදීමේදී එවකට 90% ක් පමණ පැවති ශ්‍රී ලංකාවේ සහල් නිෂ්පාදනය ස්වයංපෝෂිත තත්ත්වය දක්වා ඉහල නැංවීම ප්‍රධාන අරමුණ වී තිබුණි. මෙම අරමුණ සාක්ෂාත් කර ගැනීමට මනා පිටිවහලක් වෙමින් පොහොර භාවිතය උපරිම කර ගැනීම සඳහා එවකට පැවති රජය මඟින් අරම්භ කරන ලද මහින්ද චින්තන වැඩ පිළිවෙල යටතේ 2005 වසරේ සිට සහනාධාර ක්‍රමයට මෙම පොහොර ප්‍රමාණයන් ගොවි ජනතාවට ලබා දීමට පියවර ගන්නා ලදි. මෙහිදී සෑම පොහොර වර්ගයක්ම කිලෝ ග්‍රෑම් එකක් රුපියල් 7 ක් වැනි අවම මිලකට ගොවීනට ලබා දුන් අතර මේ නිසාම සෑම ගොවියකුම රසායනික පොහොර භාවිතයට පෙළඹවීම මගින් සහල් නිෂ්පාදනයෙන් ස්වයංපෝෂිත වීමටත් අතිරික්ත සහල් ප්‍රමාණයක් නිපදවීමටත් අපි සමත් වීමු.

## 3. 2001 වසරේ වී වගාවේ පොහොර නිර්දේශයේ සමාලෝචනය

2010 වසරේදී ගන්නොරුව පැළෑටි ජාන සම්පත් මධ්‍යස්ථානයේ පැවති වී පිළිබඳ සම්මේලනයේදී 2001 පොහොර නිර්දේශයට අනුව වී වගාවට යොදන පොහොරවල අඩු කාර්යක්‍ෂමතාවය හා අපතේ යන පොහොර මඟින් සිදුවන පරිසර හානිය පිළිබඳව ප්‍රශ්න මතු වූ අතර ඒ පිළිබඳව වැඩි අවධානයක් යොමු කල යුතු බවට තීරණය විය. මේ සඳහා වී පර්යේෂණ හා සංවර්ධන ආයතනය මගින් ඒ වනවිටත් පවත්වාගෙන යමින් තිබූ පොහොර භාවිතය කාර්යක්ෂම කිරීමේ පර්යේෂණ තව දුරටත් ශක්තිමත් කිරීමටත්, මෙම පර්යේෂණ ගොවි ක්ෂේත්‍ර තුළ ආදර්ශණ මට්ටමින් පවත්වා ගැනීමත්, අත්‍යාවශ්‍ය බව හඳුනාගන්නා ලදී.

නයිට්‍රජන්, පොස්පරස් හා පොටෑසියම් පොහොර භාවිතය කාර්යක්ෂම කිරීම සඳහා පිළිවෙලින් පත්‍ර වර්ණ දර්ශක ආධාරයෙන් නයිට්‍රජන් පොහොර ලබාදීමේ ක්‍රමවේදයත්, කන්නයක් හැර කන්නයක් පොස්පරස් පොහොර ලබාදීමේ ක්‍රමවේදයත්, පුෂ්ප මූලාකෘති ඇති අවධියේදී පමණක් පොටෑසියම් පොහොර භාවිතා කිරීමේ ක්‍රමවේදයත් පිළිබඳව ගොවි ක්ෂේත්‍රවල ආදර්ශන පැවැත්වීමට තීරණය විය. මෙයට රුකුලක් වෙමින් මෙම ආදර්ශන ගොවි ක්ෂේත්‍රවල කරගෙන යාම සඳහා ජාතික කෘෂිකර්ම පර්යේෂණ වැඩසටහන (NARP) යටතේ මුදල් ආධාර ලබා දෙන ලදී. මීට අමතරව කාබනික පොහොර යෙදීම මගින් රසායනික පොහොර භාවිතයේ කාර්යක්‍ෂමතාව වැඩිකර රසායනික පොහොර යෙදීම අවම කිරීමේ අරමුණ ඇතිව කෘෂිකර්ම අමාත්‍යාංශය මගින් කාබනික ද්‍රව්‍ය නිෂ්පාදන හා ප්‍රවර්ධන වැඩසටහනක් ශ්‍රී ලංකාව පුරා ක්‍රියාත්මක කරනු ලැබීය. මෙම පර්යේෂණ හා ආදර්ශනවලින් සාර්ථක ප්‍රතිඵල ලැබෙමින් පවතිද්දී වී වගාව සඳහා 2001 වසරේ ලබාදුන් පොහොර නිර්දේශය යාවත්කාලීන කිරීම සඳහා 2012 වසරේදී කෘෂිකර්ම අධ්‍යක්‍ෂ ජනරාල් විසින් පර්යේෂණ හා ව්‍යාප්ති අංශයන් යන දෙකම නියෝජනය වන පරිදි සාමාජිකයින් අට දෙනෙකුගෙන් සමන්විත මණ්ඩලයක් පත් කරන ලදී. (මෙම මණ්ඩලය පිළිබඳ විස්තර පිටු අංක 22 දැක්වේ) මෙම මණ්ඩලය අවස්ථා ගණනාවකදී රැස්වී වී වගාව සඳහා නව පොහොර නිර්දේශයක් ලබා දීමට ඇති හැකියාව පිළිබඳව කරුණු දීර්ඝ වශයෙන් සාකච්ඡා කරන ලදී.

## 4. 2001 පොහොර නිර්දේශය වෙනස් කිරීම සඳහා සාකච්ඡාවට භාජනය කළ විශේෂිත කරුණු

### වී වගාව සඳහා නයිට්‍රජන් පොහොර භාවිතය

වී වගාව සඳහා නයිට්‍රජන් පොහොර භාවිතය ගැන වසර ගණනාවක් තිස්සේ වී පර්යේෂණ හා සංවර්ධන ආයතනය මගින් කරන ලද පර්යේෂණවල

ප්‍රතිඵලවලට අනුව;

- නයිට්‍රජන් පොහොර සඳහා කැටිති යූරියා වෙනුවට කණිකාමය යූරියා භාවිතා කිරීම මගින් නයිට්‍රජන් පොහොරවල කාර්යක්‍ෂමතාව වැඩි කිරීමට හේතු වන බව සොයා ගෙන ඇත. මේ නිසා මතුපිට පොහොරක් ලෙස යොදන යූරියා ප්‍රමාණය 20% කින් පමණ අඩුකිරීමට හැකියාව ලැබේ.
- වී වගාව ආරම්භ කිරීමේදී ඉපනැල්ල හා පිදුරු ජීර්ණය මගින් ලැබෙන නයිට්‍රජන් ප්‍රමාණය මූලික අවධියේදී වී ශාකයට අවශ්‍ය නයිට්‍රජන් ප්‍රමාණය සැපයීමට ප්‍රමාණවත්වේ. දැනට වී වගාවේ බොහෝවිට අස්වැන්න නෙලීම සඳහා යන්ත්‍ර භාවිතා කරන හෙයින් පිදුරු නැවත ක්ෂේත්‍රයට ලැබීමක් නිරන්තරයෙන්ම සිදුවේ. මේ නිසා මූලික පොහොරක් ලෙස නයිට්‍රජන් පොහොර යෙදීම අවශ්‍ය නොවේ.
- පත්‍ර වර්ණය උපකාර කරගනිමින් නයිට්‍රජන් පොහොර යෙදීම මගින් උපරිම කාර්යක්‍ෂමතාවයකින් නයිට්‍රජන් පෝෂක ලබාදී නයිට්‍රජන් පොහොර භාවිතය අවම කිරීමට හැකියාවක් ඇති බව ද සොයා ගෙන ඇත (වගුව 2).

*වගුව 2: පත්‍ර වර්ණ දර්ශකයට අනුව හා සාමාන්‍ය ක්‍රමයට අනුව නයිට්‍රජන් පොහොර භාවිතා කිරීමේදී අවශ්‍ය වන නයිට්‍රජන් ප්‍රමාණ*

| **කාලය** | **පත්‍ර වර්ණ දර්ශක ආධාරයෙන් පොහොර භාවිතා කිරීම (හෙක්ටයාර 1ට නයිට්‍රජන් කිලෝ ග්‍රෑම්)** | **සාමාන්‍ය ආකාරයට පොහොර යෙදීම (හෙක්ටයාර 1ට නයිට්‍රජන් කිලෝ ග්‍රෑම්)** |
|---|---|---|
| මූලික | - | 5 |
| සති 1 | - | - |
| සති 2 | - | 40 |
| සති 3 | 15 | - |
| සති 4 | 20 | 65 |
| සති 5 | 25 | - |
| සති 6 | 15 | 35 |
| සති 7 | 15 | - |
| සති 8 | 15 | - |
| එකතුව | 105 | 145 |

පත්‍ර වර්ණ දර්ශක ආධාරයෙන් නයිට්‍රජන් පොහොර යෙදීම මගින් හෙක්ටයාර එකකින් නයිට්‍රජන් කිලෝ ග්‍රෑම් 40 ක් ඉතිරි කරගත හැකිය. මෙය හෙක්ටයාර එකකට යොදන මුළු යූරියා ප්‍රමාණයෙන් 28% ක් පමණ වේ. මෙහිදී නයිට්‍රජන් පොහොරවල කාර්යක්ෂමතාව ඉහළ යන හෙයින් අස්වැන්න වැඩිවීමට ද මෙය හේතුවන බව සොයාගෙන ඇත. නයිට්‍රජන් පොහොර පිළිබඳ කරන ලද පර්යේෂණවලට අනුව වී ශාකයේ පුෂ්ප මූලාකෘති අවධියට පසුවත් යම් නයිට්‍රජන් ප්‍රමාණයක් සැපයීම මඟින් ශාකය අවසාන කාලයේ නයිට්‍රජන් හිඟතාවයට පාත්‍රවීමේ අවධානම අඩු කර ගත හැකිය.

## වී වගාව සඳහා පොස්පරස් පොහොර භාවිතය

වී බෝගය සඳහා යොදන පොස්පරස් පොහොරවලින් එක් කන්නයකදී ප්‍රයෝජනයට ගන්නේ යොදන ප්‍රමාණයෙන් සියයට 20 කටත් අඩු ප්‍රමාණයකි. මේ නිසා කන්නයක් පාසා පොස්පරස් පොහොර යෙදීමේදී පසේ ඉතිරිවන පොස්පරස් පොහොරවලින් ප්‍රයෝජනයක් නොලැබේ. වසර ගණනාවක් තිස්සේ දිස්ත්‍රික්ක ගණනාවක මේ පිළිබඳව කරන ලද පර්යේෂණවලට අනුව යකඩ විෂවීම සහිත කුඹුරු හැරෙන්නට අනෙක් කුඹුරුවල කන්නයක් පාසා පොස්පරස් යෙදුවත් කන්න 2 ක් හෝ 3 ක් යන තෙක් පොස්පරස් පොහොර නිසා අස්වැන්නෙහි සැලකිය යුතු වෙනසක් දැකිය නොහැකිය. සාර්ථක වී වගාවක් සඳහා පසේ තිබිය යුතු ප්‍රශස්ත පාංශු පොස්පරස් මට්ටම පස් කිලෝ ග්‍රෑම් එකකට පොස්පරස් මිලි ග්‍රෑම් 10 කි. නමුත් වැඩි අස්වැන්නක් ලැබෙන වියලි කලාපයේදීත් ලබා ගත හැකි පාංශු පොස්පරස් ප්‍රමාණය කිලෝ ග්‍රෑම් එකකට මිලි ග්‍රෑම් 5ක මට්ටමේදී පවා පොස්පරස් පොහොර යෙදීම මගින් අස්වැන්නේ සැලකිය යුතු වැඩිවීමක් වාර්තා වී නොමැත. මීට අමතරව පාංශු පොස්පරස්වල සුලභතාව කන්නය අනුව වෙනස් වන බව ද වාර්තා වී ඇති අතර පොළොන්නරුව දිස්ත්‍රික්කයේ පසුගිය කන්නවල කරන ලද පර්යේෂණවලට අනුව පොස්පරස් භාවිතා නොකරන අවස්ථාවල පවා මහ කන්නය අවසානයේදී පොස්පරස්වල සුලභතාවය ඉහළ යන බව වාර්තා වී ඇත.

## වී වගාව සඳහා පොටෑසියම් පොහොර භාවිතය

වී පර්යේෂණ හා සංවර්ධන ආයතනය මගින් මෑත කාලයේදී කරන ලද පර්යේෂණවලට අනුව කුඹුරු ඉඩම්වල වගාව ආරම්භ කර සති 2 - 3 ක කාලයක් යන තෙක් ඉපනැල්ල ජීර්ණය වීම මගින් සපයන පොටෑසියම් නිසා හුවමාරු කල හැකි පාංශු පොටෑසියම් ප්‍රමාණයේ වැඩිවීමක් දක්නට ලැබෙන බව සොයාගෙන ඇත. මෙම පොටෑසියම් වැඩිවීම පිදුරු භාවිතයත් සමග තවදුරටත් ඉහළ යන අතර පිදුරු හා ඉපනැල්ලෙන් ලැබෙන පොටෑසියම් ප්‍රමාණය වී බෝගයට සති 3 - 4 දක්වා කාලයකට ප්‍රමාණවත් වෙයි. එමෙන්ම වී වගාවේ සති 4 සිට 8 දක්වා කාලය පොටෑසියම් විශාල වශයෙන් අවශ්‍ය වන

අතර මේ කාලයේදී පොටෑසියම් අඩුවීම වී බෝගය රෝග හා පළිබෝධවලට පාත්‍ර වීමටත් විශාල වශයෙන් අස්වැන්න අඩු වීමටත් හේතු වේ.

**වී වගාවේ වර්තමාන තත්ත්වය පිළිබඳ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ව්‍යාප්ති අංශයේ තොරතුරු**

කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ව්‍යාප්ති අංශය මගින් 2001 සිට 2012 දක්වා වී වගාව හා පොහොර භාවිතය පිළිබඳ රැස් කරන ලද සමාජ ආර්ථික දත්තවලට අනුව 2001 පොහොර නිර්දේශය ලබා දීමෙන් පසුව හා 2005 දී පොහොර සහනාධාර තත්ත්ව යටතේ ගොවීන්ට පොහොර වර්ග තුනම ලබාදීමත් සමග ශ්‍රී ලංකාවේ සෑම ගොවියෙක්ම පාහේ කුඹුරු ඉඩම් සඳහා රසායනික පොහොර යෙදීමට පෙළඹී ඇත. කෙසේ වෙතත් දැනට හඳුනාගෙන ඇති තොරතුරුවලට අනුව වර්තමාන තත්ත්ව යටතේදී නිර්දේශිත පොහොර ප්‍රමාණ යෙදුවද අපේක්ෂිත අස්වැන්න නොලැබෙන හෙයින් විශාල පොහොර ප්‍රමාණයක් අපතේ යන තත්ත්වයට පත්ව ඇත. මේ අනුව පාංශු හා දේශගුණික තත්ත්ව හඳුනාගෙන ඊට උචිත වී වර්ග වගා කරන්නේ නම් මීට වඩා අඩු පොහොර ප්‍රමාණයකින් දැනට ලබා ගන්නා අස්වැන්නට වඩා වැඩි අස්වැන්නක් වුවද ලබා ගත හැකිය.

**ජාතික කෘෂිකර්ම පර්යේෂණ වැඩ සටහන (NARP) ව්‍යාපෘතියේ ප්‍රතිඵල**

2011 සිට 2013 දක්වා ජාතික කෘෂිකර්ම පර්යේෂණ වැඩ සටහන (NARP) යටතේ කුරුණෑගල, පොළොන්නරුව, හම්බන්තොට හා කළුතර යන දිස්ත්‍රික්කවල වී පර්යේෂණ හා සංවර්ධන ආයතනය මගින් කරන ලද පර්යේෂණවල ප්‍රතිඵලවලට අනුව වී වගාවේදී පත්‍ර වර්ණ දර්ශකයට අනුව යූරියා පොහොර යෙදීම මගින් වියලි, අතරමැදි හා තෙත් කලාපයේ භාවිතා කරන යූරියා ප්‍රමාණය සියයට 30 - 40 ක් පමණ ඉතිරි කරගත හැකි බව සොයාගෙන ඇත. මීට අමතරව පොළොන්නරුව දිස්ත්‍රික්කයේ කරන ලද පර්යේෂණවලට අනුව යූරියා ඉතිරි වනවාට අමතරව 5% ක් පමණ අස්වැන්නේ වැඩි වීමක් ද වාර්තා කොට ඇත. එමෙන්ම යකඩ විෂවීමේ තත්ත්වය රහිත කුඹුරුවලට කන්නයක් හැර කන්නයක් පොස්පරස් පොහොර යෙදීම මගින් කන්නයක් පාසා පොස්පරස් පොහොර යොදන කුඹුරුවලට සමාන අස්වැන්නක් ලබාගත හැකි බව සොයා ගෙන ඇත. නමුත් යකඩ විෂවීම සහිත කුඹුරුවලට කන්නයක් පාසා පොස්පරස් පොහොර යෙදීම අත්‍යාවශ්‍යය. පර්යේෂණවලට අනුව පුෂ්ප මූලාකෘති අවධියේදී පමණක් පොටෑසියම් පොහොර යෙදීම මගින් මූලික පොහොර හා පුෂ්ප මූලාකෘති අවධියේ යන අවස්ථා දෙකකදී පොටෑසියම් පොහොර යොදා ලබා ගන්නා අස්වැන්නට සමාන අස්වැන්නක් ලබා ගත හැකි බව සොයා ගෙන ඇත.

## ලෝක වෙළඳපොලේ පොහොර මිල ගණන්

ලෝක වෙළඳපොලේ පොහොර මිල ගණන්වලට අනුව වසර 2000 දී ලෝක වෙළඳපොලේ යූරියා, ටී.එස්.පී. හා එම්.ඕ.පී. ටොන් 1 ක ආනයනික මිල පිළිවෙළින් ඇමරිකන් ඩොලර් 135, 187 හා 175 වු අතර මෙම මිල ගණන් 2010 වන විට පිළිවෙළින් ඇමරිකන් ඩොලර් 534, 903 හා 493 දක්වා කිහිප ගුණයකින් වැඩි වී ඇත.

## පොහොර මගින් පස හා ජල දූෂණය ආශ්‍රිතව ඇති දේශීය වාර්තා

පස ජල දූෂණය ආශ්‍රිතව රජරට ප්‍රදේශයේ පැතිර යන වකුගඩු රෝගයට හේතු කාරක වන ද්‍රව්‍ය පිළිබඳව ශ්‍රී ලාංකික විද්‍යාඥයින් මගින් හා ලෝක සෞඛ්‍ය සංවිධානය මගින් ඉදිරිපත් කර ඇති වාර්තාවලට අනුව වී වගාව සඳහා භාවිතා කරන පොස්පරස් පොහොරවලින් ලැබෙන කැඩ්මියම් වැනි බැරලෝහ උතුරු මැද පලාතේ පැතිර යන වකුගඩු රෝගයට හේතුවක් ලෙස සැක පහල කර ඇත.

## වී අස්වැන්න පිළිබඳ සංඛ්‍යා ලේඛණ අංශයේ වාර්තා

වසර 2005 දී පොහොර සහනාධාර ක්‍රමවේදය යටතේ හෙක්ටයාර එකකට ටොන් 6 - 7 ක් දක්වා ලබා ගත හැකිවන පරිදි වාරි පෝෂිත ඉඩම්වලට අවශ්‍ය පෝෂක අගයයන් ගණනය කොට අවශ්‍ය සියලුම පොහොර ප්‍රමාණයන් සහනාධාර මට්ටමින් ලබාදී තිබුණි. එහෙත් 2005 වසරේ පොහොර සහනාධාරය ලබා දීමේ සිට 2010 වර්ෂය දක්වා ජන හා සංඛ්‍යා ලේඛණ දෙපාර්තමේන්තුව මගින් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් ලබාගෙන ඇති ගොවි ක්ෂේත්‍රවල අස්වනු සමීක්ෂණ වාර්තාවලට අනුව පහත 1, 2, 3 හා 4 රූපවලින් දැක්වෙන ආකාරයට වැඩි වශයෙන් වාරි පෝෂිත ඉඩම් ඇති කිසිම දිස්ත්‍රික්කයක් සාමාන්‍ය අස්වැන්න හෙක්ටයාර එකකට ටොන් 6 ක් හෝ ඊට වැඩියෙන් ලබාගෙන නොමැත. හෙක්ටයාර එකකට ටොන් 6 ට වඩා සාමාන්‍ය අස්වැන්න ලබා ගත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ ගණන පවා 20 කටත් අඩුය. රූපය 1, 2, 3, 4 හි අස්වනු දත්ත තව දුරටත් පරීක්ෂා කිරීමේදී හෙලිවන කරුණු වන්නේ වියලි කලාපයේ සෑම දිස්ත්‍රික්කයකම සාමාන්‍ය අස්වැන්න හෙක්ටයාර එකකට ටොන් 4 හෝ ඊට ආසන්න වී ඇති අතර තෙත් කලාපයේ සමහර දිස්ත්‍රික්ක හැරෙන්නට අනෙක් සියලුම දිස්ත්‍රික්කවල අවම අස්වැන්න ද හෙක්ටයාර එකකට ටොන් 3ට වඩා ඉහල මට්ටමකට ලඟා වී ඇති බවයි. මේ අනුව 2001 පොහොර නිර්දේශය හා පොහොර සහනාධාරය මගින් කුඹුරුවල අවම අස්වැන්න වැඩි කර ඇතත් උපරිම අස්වැන්න තව දුරටත් වැඩි කිරීම සීමාවී ඇත. මෙයින් ගම්‍ය වන ප්‍රධාන කරුණ වන්නේ උපරිම අස්වැන්න වැඩි කිරීම සඳහා පොහොර පමණක් ලබා දීම ප්‍රමාණවත් නොවන අතර ඒ සඳහා සාර්ථක වල් මර්ධනය, සාර්ථක ජල පාලනය හා කාබනික ද්‍රව්‍ය එක්කිරීම වැනි කටයුතු ද අනිවාර්යයෙන් කල යුතු බවයි. එමෙන්ම විවිධ පාංශු තත්ත්වයනට යෝග්‍ය වන පරිදි නිපදවා ඇති වී වර්ග ද භාවිතා කල යුතු බවයි.




රූපය 1 වාරි පෝෂිත තත්ත්ව යටතේ මහ කන්නයේ වී අස්වැන්න (හෙක්ටයාර එකකට ටොන්)




රූපය 2 වාරි පෝෂිත තත්ත්ව යටතේ යල කන්නයේ වී අස්වැන්න (හෙක්ටයාර එකකට ටොන්)




රූපය 3 වර්ෂා පෝෂිත තත්ත්ව යටතේ මහ කන්නයේ වී අස්වැන්න (හෙක්ටයාර එකකට ටොන්)




රූපය 4 වර්ෂා පෝෂිත තත්ත්ව යටතේ යල කන්නයේ වී අස්වැන්න (හෙක්ටයාර එකකට ටොන්)

**දත්ත සඳහා අනුග්‍රහය : ජන හා සංඛ්‍යා ලේඛණ දෙපාර්තමේන්තුව**

**පහතරට තෙත් කලාපයේ කුඹුරු ඉඩම්වල ඵලදායීතාව නැංවීමේ ව්‍යාපෘති වාර්තා**

පහතරට තෙත් කලාපයේ කුඹුරු ඉඩම්වල ඵලදායීතාව නැංවීම සඳහා වී පර්යේෂණ හා සංවර්ධන ආයතනය මගින් 2012 වසරේදී ආරම්භ කරන ලද ව්‍යාපෘතියේ මූලික සමීක්ෂණවලට අනුව තෙත් කලාපයේ කුඹුරුවල යකඩ විෂවීමට අමතරව පස ආම්ලික වීමත් පොස්පරස් හා පොටෑසියම් පෝෂක අඩුවීමත් ප්‍රධාන ප්‍රශ්න බවට පත්ව ඇත. මෙම ඉඩම්වල ඵලදායීතාව ඉහල නැංවීමට නම් පොස්පරස් හා පොටෑසියම් පොහොර මනා ලෙස කළමනාකරණය කල යුතුය. මේ නිසාම විශේෂ වශයෙන් මෙම කලාපයේ ගොවීන් පොටෑසියම් පොහොරවලට වැඩි ඉල්ලුමක් පෙන්වයි.

**කාබනික පොහොර නිෂ්පාදන හා ප්‍රවර්ධන වැඩ සටහනේ ප්‍රතිඵල**

කාබනික පොහොර නිෂ්පාදන හා ප්‍රවර්ධන වැඩ සටහනට අදාලව පර්යේෂණ හා ව්‍යාප්ති අංශය මගින් ඉදිරිපත් කරන ලද ප්‍රතිඵලවලට අනුව කාබනික ද්‍රව්‍ය යෙදීම මගින් කුඹුරුවල වී අස්වැන්න වැඩිකර ගත හැකි අතර රසායනික පොහොරවල කාර්යක්ෂමතාව ඉහල යාම මගින් රසායනික පොහොරවල අවශ්‍යතාව ද අඩු කර ගත හැකිය.

## 5. 2013 පොහොර නිර්දේශයේ නයිට්‍රජන්, පොස්පරස් හා පොටෑසියම් පොහොර භාවිතය සඳහා කර ඇති වෙනස්කම්

නයිට්‍රජන් පොස්පරස් හා පොටෑසියම් පොහොරවල කාර්යක්ෂමතාව වැඩි කිරීමට අවශ්‍ය කාරණා ගණනාවක් හඳුන්වා දීම මගින් අස්වැන්න වැඩිකිරීමට අමතරව පොහොර භාවිතය අවම කිරීමට අවශ්‍ය පියවර ඉදිරිපත් කිරීම 2013 පොහොර නිර්දේශයේ විශේෂත්වයයි. ඉහත අංක 4 හි කරුණු ආශ්‍රය කර ගනිමින් 2013 පොහොර නිර්දේශයේ මූලික පොහොරක් ලෙස යූරියා අඩංගු නොකිරීමට පොහොර නිර්දේශ කිරීමේ කිමිටුව විසින් තීරණය කර ඇත. එමෙන්ම පත්‍ර වර්ණ දර්ශක හඳුන්වා දීම අත්‍යාවශ්‍ය කරුණක් ලෙස ද පිළිගෙන ඇති අතර පත්‍ර වර්ණ දර්ශක ගොවීන්ට හඳුන්වා දෙන තෙක් වර්ණ දර්ශක අනුව සොයා ගත් නයිට්‍රජන් ප්‍රමාණයන් නියමිත වේලාවන්හිදී යෙදීමට අවධාරනය කර ඇත. මීට අමතරව නයිට්‍රජන් මගින් අස්වැනන්ට කරන බලපෑම අවම කිරීම සඳහා පුෂ්ප මූලාකෘති අවධියට සති 2 කට පසුවත් කිසියම් නයිට්‍රජන් පොහොර ප්‍රමාණයක් යෙදීමට කමිටුව විසින් නිර්දේශ කර ඇත. හැකි සෑම අවස්ථාවකම කැටිති යූරියා වෙනුවට කණිකාමය යූරියා යෙදීම අවශ්‍ය බව ද කමිටුව විසින් නිර්දේශයේ සඳහන් කර ඇත.

පසේ ඉතිරි වන පොස්පරස් ප්‍රමාණය අවම කිරීමට පොස්පරස් පොහොර කන්නයක් පාසා යොදනු වෙනුවට කන්නයක් හැර කන්නයක් යෙදිය හැකි බව පර්යේෂණ තොරතුරු අනුව වාර්තා වුවත් එය ප්‍රදේශය අනුව වෙනස් වන හෙයින් තවදුරටත් මේ පිළිබඳව පර්යේෂණ කර ප්‍රතිඵල වාර්ථා කරන තෙක් යකඩ විෂවීම රහිත කුඹුරු සඳහා 2001 වසරේ නිර්දේශකර තිබූ ත්‍රිත්ව සුපර් පොස්පේට් පොහොර ප්‍රමාණයට වඩා අඩු පොස්පරස් ප්‍රමාණයක් කන්නයක් පාසාම ලබාදීමට 2013 නව නිර්දේශයේ පියවර ගෙන ඇත. යකඩ විෂවීම සහිත තෙත් කලාපයේ කුඹුරු සඳහා 2001 නිර්දේශිත පොස්පරස් ප්‍රමාණයන්ම තව දුරටත් යෙදීම නිර්දේශ කර ඇත.

වී වගාවේ මූලික පොටෑසියම් අවශ්‍යතාවය සැපිරීමට ඉපනැල්ලට හා පිදුරුවලට හැකියාවක් ඇති බවට කරන ලද පැහැදිලි කිරීම්වලට අනුව මූලික පොහොරක් ලෙස පොටෑසියම් පොහොර යෙදීමක් අවශ්‍ය නොවන බව අවධාරනය කරන කමිටුව 2013 නව පොහොර නිර්දේශයේ මූලිකව පොටෑසියම් පොහොර යෙදීමට නිර්දේශ කර නොමැත. වී ශාකයේ වයස සති 4 සිට ඉහලට පොටෑසියම්වලට විශාල ඉල්ලුමක් පවතින හෙයින් 2013 නව පොහොර නිර්දේශයේ මල් පිපීමට පෙර අවස්ථා 2 කදී සමාන ප්‍රමාණවලින් පොටෑසියම් පොහොර දැමීම නිර්දේශ කර ඇත. යකඩ විෂවීම සහිත කුඹුරුවල පොටෑසියම් පෝෂකය හිඟ වීම යකඩ විෂවීම තීව්‍ර කිරීමට හේතුවන බව පාදක කර ගනිමින් තෙත් කලාපයේ වර්ෂා පෝෂිත කුඹුරු සඳහා අමතර පොටෑසියම් පොහොර ප්‍රමාණයක් යෙදීමට 2013 නව නිර්දේශයෙන් නිර්දේශ කොට ඇත.

## 6. 2013 පොහොර නිර්දේශයේ සින්ක් පොහොර භාවිතය

ශ්‍රී ලංකාවේ කුඹුරු බොහොමයක සින්ක් (Zn) මූල ද්‍රව්‍යය ඌණ ව පවතින බවට වාර්තා කර ඇති හෙයින් 2001 දී මෙන්ම මෙවර ද වී වගාව සඳහා සින්ක් (Zn) අඩංගු සින්ක් සල්පේට් පොහොරක් ලෙස සියලුම ප්‍රදේශ සඳහා නිර්දේශ කර ඇත. මේ අනුව වසරකට වරක් මහ කන්නයේ මූලික පොහොරක් ලෙස සින්ක් සල්පේට් යෙදීමට නිර්දේශ කර ඇත.

## 7. 2013 පොහොර නිර්දේශයේ කාබනික ද්‍රව්‍ය භාවිතය

පොහොර භාවිතයේ කාර්යක්ෂමතාව ඉහල නැංවීම සඳහා කුඹුරු ඉඩම්වලට කාබනික ද්‍රව්‍ය යෙදීම ඉතාමත්ම අත්‍යාවශ්‍ය කරුණක් ලෙස 2001 දී සඳහන් කර තිබුණි. මීට අමතරව විවිධ පොහොර මට්ටම් සමග වසර 13 ක් තිස්සේ වී පර්යේෂණ හා සංවර්ධන ආයතනය මගින් කරන ලද පර්යේෂණවලට අනුව පසේ සශ්‍රිකත්වය දිගු කාලීනව පවත්වා ගෙන යාම සඳහා සහ බැර ලෝහවල සුලභතාවය අඩු කිරීම සඳහා කාබනික පොහොර පසට යෙදීම අත්‍යාවශ්‍ය බව සොයාගෙන ඇත. වැඩි ප්‍රමාණයක් ගොවීන් කාබනික ද්‍රව්‍ය

යෙදීම එතරම් ගණනකට නොගෙන රසායනික පොහොරවලින් පමණක් වගා කටයුතු කරගෙන ගොස් ඇති බැවින් පොහොර භාවිතය කාර්යක්ෂම කිරීමේ අරමුණින් වර්තමාන රජය කාබනික පොහොර ප්‍රවර්ධන වැඩසටහනක් දැනට වසර කීපයක සිට පවත්වාගෙන යනු ලබයි. මේ අනුව රසායනික පොහොරවල කාර්යක්ෂමතාවය ඉහල දැමීම සඳහා කාබනික ද්‍රව්‍ය යෙදීම 2013 නව පොහොර නිර්දේශයේදී ද අත්‍යාවශ්‍ය අංගයක් ලෙස අඩංගු කර ඇත. කාබනික ද්‍රව්‍ය ලෙස පිදුරු, කොම්පෝස්ට්, ගව පොහොර, කුකුළු පොහොර හා කොළ පොහොර භාවිතා කල හැකිය. කාබනික පොහොර භාවිතා කල යුතු ප්‍රමාණයන් ලෙස පසුගිය කන්නයේ කුඹුරේ සියලුම පිදුරු ප්‍රමාණයන් ද කොම්පෝස්ට් හෙක්ටයාර එකකට ටොන් 2.5 ක් ද ගොම හෙක්ටයාර එකකට ටොන් 4 ක් පමණ ද කුකුළු පොහොර නම් හෙක්ටයාර එකකට ටොන් 2 ක් පමණ ද කොළ පොහොර හෙක්ටයාර එකකට ටොන් 1 ක් පමණ ද දැමීම නිර්දේශ කොට ඇත.

## 8. 2013 පොහොර නිර්දේශයේ ඇති රසායනික පොහොර වර්ග

නයිට්‍රජන් පෝෂකය සඳහා කණිකාමය යූරියා යෙදීම ද පොස්පරස් පෝෂකය සඳහා ත්‍රිත්ව සුපර් පොස්පේට් යෙදීම ද පොටෑසියම් පෝෂකය සඳහා මියුරේට් ඔෆ් පොටෑෂ් යෙදීම ද සින්ක් පෝෂකය සඳහා සින්ක් සල්ෆේට් යෙදීම ද තව දුරටත් කළ යුතු බව 2013 පොහොර නිර්දේශ කිරීමේ කමිටුව විසින් නිර්දේශ කර ඇත.

## 9. පොහොර නිර්දේශය සඳහා ප්‍රදේශ වෙන්කර හඳුනා ගැනීම

අස්වැන්නේ විචල්‍යතාවයන් ප්‍රයෝජනයට ගනිමින් වාරිපෝෂිත වී වගාව මහා වාරි හා සුළු වාරි වශයෙන් 2001 නිර්දේශයේදී කොටස් 2 කට බෙදා තිබුණි. මෙම අවස්ථා දෙකේදීම ජල සම්පාදනය පමණක් අරමුණු කරගෙන ඇති හෙයින් ස්ථිර ජල සම්පාදන හැකියාවක් ඇතිවිට සුළු වාරි ප්‍රදේශවල මහා වාරිවලට සමාන අස්වැන්නක් ද ජල සම්පාදන හැකියාව දුර්වල වනවිට මහා වාරි ප්‍රදේශවල අස්වැන්න සුළු වාරිවලට සමාන වන බව ද පෙනීගිය හෙයින් 2013 පොහොර නිර්දේශයේ සුළු හා මහා වාරි අවස්ථා දෙකම වෙනුවට ජල සම්පාදිත වී වගාව වශයෙන් එය වෙනස් කර ඇත. මේ අනුව 2013 පොහොර නිර්දේශය වාරි පෝෂිත හා වර්ෂා පෝෂිත ලෙස පමණක් වී වගා ප්‍රදේශවලට වෙන්කර දක්වා ඇත.

## 10. පොහොර නිර්දේශය සකස් කිරීමේදී හඳුනාගත් කලාප

වර්ෂාපතනය අනුව ශ්‍රී ලංකාව තෙත් කලාපය, අතරමැදි කලාපය හා වියලි කලාපය ලෙස ප්‍රධාන කලාප 3 කට බෙදා වෙන්කර ඇතත් පාංශු හා දේශගුණික තත්ව උපයෝගී කරගෙන පොහොර නිර්දේශ කිරීමේදී ප්‍රධාන

කලාප 2 ක් පමණක් හඳුනාගෙන ඇත. තෙත් කලාපය එක් කලාපයක් ලෙස ද වියලි හා අතරමැදි කලාපය අනෙක් කලාපය ලෙස ද හඳුනාගෙන ඇත.

මේ අනුව නව පොහොර නිර්දේශය ප්‍රධාන කාණ්ඩ 4 කට පමණක් සීමාකර ඇත. එනම් වියලි හා අතරමැදි කලාප සඳහා ජලසම්පාදිත තත්ත්ව යටතේ වී වගාවට පොහොර නිර්දේශය, වියලි හා අතරමැදි කලාප සඳහා වර්ෂා පෝෂිත තත්ත්ව යටතේ වී වගාවට පොහොර නිර්දේශය, තෙත් කලාපය සඳහා ජලසම්පාදිත තත්ත්ව යටතේ වී වගාවට පොහොර නිර්දේශය හා තෙත් කලාපය සඳහා වර්ෂා පෝෂිත තත්ත්ව යටතේ වී වගාවට පොහොර නිර්දේශය යනුවෙනි. පොහොර නිර්දේශය සඳහා හඳුනාගෙන ඇති කලාප පිලිබඳ සම්පූර්ණ විස්තරයක් වගුව 3 හා රූප සටහන 5 මගින් දක්වා ඇත.

*වගුව 3. පොහොර නිර්දේශ සකස් කිරීමේදී වියලි, අතර මැදි හා තෙත් කලාප වලට අයත් වන ලෙස වෙන්කරන ලද දිස්ත්‍රික්ක හා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ*

| **දිස්ත්‍රික්ක** | **අතරමැදි හා වියලි කලාපයට අදාල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ** | **තෙත් කලාපයට අදාල වන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ** |
|---|---|---|
| අනුරාධපුරය, පොළොන්නරුව, මොණරාගල, හම්බන්තොට, මුලතිව්, යාපනය, කුරුණෑගල, පුත්තලම, මන්නාරම, වවුනියාව, අම්පාර, මඩකලපුව, ත්‍රිකුණාමලය, කිලිනොච්චිය හා බදුල්ල | සියලුම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය | නැත |
| කෑගල්ල, ගම්පහ, කොළඹ, ගාල්ල හා කළුතර | නැත | සියළුම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ |
| මහනුවර | මිනිපේ, උඩදුම්බර, පන්විල, මැදදුම්බර, කුණ්ඩසාලේ, පාතහේවාහැට, දෙල්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ | මිනිපේ, උඩදුම්බර, පන්විල, මැදදුම්බර, කුණ්ඩසාලේ, පාතහේවාහැට, දෙල්තොට හැර ඉතිරි සියළුම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ |
| මාතලේ | යටවත්ත හා උකුවෙල හැර ඉතිරි සියළුම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ | යටවත්ත හා උකුවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ |
| නුවරඑළිය | හඟුරන්කෙත හා වලපනේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ | හඟුරන්කෙත හා වලපනේ හැර ඉතිරි සියළුම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ |
| රත්නපුර | ඇඹිලිපිටිය, කොලොන්න, බලන්ගොඩ, ඉඹුල්පේ හා වැලිගෙපොල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ | ඇඹිලිපිටිය, කොලොන්න, බලන්ගොඩ, ඉඹුල්පේ හා වැලිගෙපොල හැර ඉතිරි සියළුම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ |
| මාතර | හක්මන, කිරින්ද, දෙවිනුවර, දික්වැල්ල, තිහගොඩ, කඹුරුපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ | හක්මන, කිරින්ද, දෙවිනුවර, දික්වැල්ල, තිහගොඩ, කඹුරුපිටිය හැර ඉතිරි සියළුම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ |




*රූපය 5. තෙත් කලාපයට අයත් දිස්ත්‍රික්කවල අතරමැදි හා වියලි කලාපයට අයත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ*

## 10.1. වියලි හා අතරමැදි කලාප සඳහා ජල සම්පාදිත තත්ත්ව යටතේ වී වගාවට අවශ්‍ය පෝෂක ප්‍රමාණ හා පොහොර නිර්දේශය

වියලි හා අතරමැදි කලාපවල සියළුම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ සඳහා ජල සම්පාදිත තත්ත්ව යටතේ වී වගා කිරීමේදී නිර්දේශ කරනු ලබන පෝෂක ප්‍රමාණයන් වගු අංක 4න් දැක්වේ. උපරිම කාර්යක්ෂමතාවයක් සඳහා විවිධ වයස් කාණ්ඩවල වී වර්ගවලට ලබා දිය යුතු පොහොර ප්‍රමාණයන් හා කාල සීමාවන් වගු අංක 5න් දැක්වේ.

*වගුව 4. වියලි හා අතරමැදි කලාපවල ජල සම්පාදිත තත්ත්ව යටතේ වී වගා කිරීමේදී නිර්දේශිත පෝෂක ප්‍රමාණයන් (හෙක්ටයාර එකකට කිලෝ ග්‍රෑම්)*

| **නයිට්‍රජන්** (N) | **පොස්පරස් පෙන්ටොක්සයිඩ්** ($P_2O_5$) | **පොටෑසියම් ඔක්සයිඩ්** ($K_2O$) | **සින්ක්** (Zn) |
|---|---|---|---|
| 105 | 25 | 35 | 1 |

*වගුව 5. වියලි හා අතරමැදි කලාපවල ජල සම්පාදිත තත්ත්ව යටතේ වගා කිරීමේදී විවිධ වයස් කාණ්ඩවල වී වර්ග සඳහා ලබා දිය යුතු පොහොර ප්‍රමාණයන් හා කාල සීමාවන්*

| **වී වර්ගය** | **යොදන කාලය (සිටුවීමට හෝ වැපිරීමට පසු)** | **පොහොර වර්ගය හා ප්‍රමාණය (හෙක්ටයාර එකකට කිලෝ ග්‍රෑම්)** | | | |
|---|---|---|---|---|---|
| | | **යූරියා** | **ටී.එස්.පී.** | **එම්.ඕ.පී.** | **සින්ක් සල්ෆේට්** |
| මාස 3 වී වර්ග සඳහා | මූලික | | 55 | | 5 |
| | සති 2 | 50 | | | |
| | සති 4 | 75 | | 25 | |
| | සති 6 | 65 | | 35 | |
| | සති 7 | 35 | | | |
| එකතුව | | 225 | 55 | 60 | 5 |
| මාස 3 1/2 වී වර්ග සඳහා | මූලික | | 55 | | 5 |
| | සති 2 | 50 | | | |
| | සති 4 | 75 | | 25 | |
| | සති 6 | 65 | | 35 | |
| | සති 8 | 35 | | | |
| එකතුව | | 225 | 55 | 60 | 5 |
| මාස 4 වී වර්ග සඳහා | මූලික | | 55 | | 5 |
| | සති 2 | 50 | | | |
| | සති 4 | 75 | | 25 | |
| | සති 7 | 65 | | 35 | |
| | සති 9 | 35 | | | |
| එකතුව | | 225 | 55 | 60 | 5 |

## 10.2. වියලි හා අතරමැදි කලාප සඳහා වර්ෂා ජලයෙන් පමණක් වී වගා කරන විට වී වගාවට අවශ්‍ය පෝෂක ප්‍රමාණ හා පොහොර නිර්දේශය

වියලි හා අතරමැදි කලාපවල සියළුම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ සඳහා වර්ෂා ජලයෙන් පමණක් වී වගා කිරීමේදී නිර්දේශ කරනු ලබන පෝෂක ප්‍රමාණයන් වගු අංක 6න් දැක්වේ. උපරිම කාර්යක්ෂමතාවයක් සඳහා විවිධ වයස් කාණ්ඩවල වී වර්ගවලට ලබා දිය යුතු පොහොර ප්‍රමාණයන් හා කාල සීමාවන් වගු අංක 7න් දැක්වේ.

*වගුව 6. වියලි හා අතරමැදි කලාපවල වර්ෂා ජලයෙන් පමණක් වී වගා කිරීමේදී නිර්දේශිත පෝෂක ප්‍රමාණයන් (හෙක්ටයාර එකකට කිලෝ ග්‍රෑම්)*

| **නයිට්‍රජන්** (N) | **පොස්පරස් පෙන්ටොක්සයිඩ්** ($P_2O_5$) | **පොටෑසියම් ඔක්සයිඩ්** ($K_2O$) | **සින්ක්** (Zn) |
|---|---|---|---|
| 80 | 15 | 30 | 1 |

*වගුව 7. වියලි හා අතරමැදි කලාපවල වර්ෂා ජලයෙන් පමණක් වී වගා කිරීමේදී විවිධ වයස් කාණ්ඩවල වී වර්ග සඳහා ලබා දිය යුතු පොහොර ප්‍රමාණයන් හා කාල සීමාවන්*

| **වී වර්ගය** | **යොදන කාලය (සිටුවීමට හෝ වැපිරීමට පසු)** | **පොහොර වර්ගය හා ප්‍රමාණය (හෙක්ටයාර එකකට කිලෝ ග්‍රෑම්)** | | | |
|---|---|---|---|---|---|
| | | **යූරියා** | **ටී.එස්.පී.** | **එම්.ඕ.පී.** | **සින්ක් සල්ෆේට්** |
| මාස 3 වී වර්ග සඳහා | මූලික | | 35 | | 5 |
| | සති 2 | 30 | | | |
| | සති 4 | 65 | | 25 | |
| | සති 6 | 50 | | 25 | |
| | සති 7 | 30 | | | |
| එකතුව | | 175 | 35 | 50 | 5 |
| මාස 3 1/2 වී වර්ග සඳහා | මූලික | | 35 | | 5 |
| | සති 2 | 30 | | | |
| | සති 4 | 65 | | 25 | |
| | සති 6 | 50 | | 25 | |
| | සති 8 | 30 | | | |
| එකතුව | | 175 | 35 | 50 | 5 |

## 10.3 තෙත් කලාපය සඳහා ජල සම්පාදිත තත්ත්ව යටතේ වී වගාවට අවශ්‍ය පෝෂක ප්‍රමාණ හා පොහොර නිර්දේශය

තෙත් කලාපයේ සියළුම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ සඳහා ජල සම්පාදිත තත්ත්ව යටතේ වී වගා කිරීමේදී නිර්දේශකර ඇති පෝෂක ප්‍රමාණයන් වගු අංක 8න් දැක්වේ. උපරිම කාර්යක්ෂමතාවයක් සඳහා විවිධ වයස් කාණ්ඩවල වී වර්ගවලට ලබා දිය යුතු පොහොර ප්‍රමාණයන් හා කාල සීමාවන් වගු අංක 9න් දැක්වේ.

*වගුව 8. තෙත් කලාපය සඳහා ජල සම්පාදිත තත්ත්ව යටතේ වී වගා කිරීමේදී නිර්දේශිත පෝෂක ප්‍රමාණයන් (හෙක්ටයාර එකකට කිලෝ ග්‍රෑම්)*

| **නයිට්‍රජන්** (N) | **පොස්පරස් පෙන්ටොක්සයිඩ්** ($P_2O_5$) | **පොටෑසියම් ඔක්සයිඩ්** ($K_2O$) | **සින්ක්** (Zn) |
|---|---|---|---|
| 65 | 15 | 30 | 1 |

*වගුව 9. තෙත් කලාපය සඳහා ජල සම්පාදිත තත්ත්ව යටතේ වී වගා කිරීමේදී විවිධ වයස් කාණ්ඩවල වී වර්ග සඳහා ලබා දිය යුතු පොහොර ප්‍රමාණයන් හා කාල සීමාවන්*

| **වී වර්ගය** | **යොදන කාලය (සිටුවීමට හෝ වැපිරීමට පසු)** | **පොහොර වර්ගය හා ප්‍රමාණය (හෙක්ටයාර එකකට කිලෝ ග්‍රෑම්)** | | | |
|---|---|---|---|---|---|
| | | **යූරියා** | **ටී.එස්.පී.** | **එම්.ඕ.පී.** | **සින්ක් සල්ෆේට්** |
| මාස 3 වී වර්ග සඳහා | මූලික | | 35 | | 5 |
| | සති 2 | 20 | | | |
| | සති 4 | 55 | | 25 | |
| | සති 6 | 45 | | 25 | |
| | සති 7 | 20 | | | |
| එකතුව | | 140 | 35 | 50 | 5 |
| මාස 3 1/2 වී වර්ග සඳහා | මූලික | | 35 | | 5 |
| | සති 2 | 20 | | | |
| | සති 4 | 55 | | 25 | |
| | සති 6 | 45 | | 25 | |
| | සති 8 | 20 | | | |
| එකතුව | | 140 | 35 | 50 | 5 |
| මාස 4 වී වර්ග සඳහා | මූලික | | 35 | | 5 |
| | සති 2 | 20 | | | |
| | සති 4 | 55 | | 25 | |
| | සති 7 | 45 | | 25 | |
| | සති 9 | 20 | | | |
| එකතුව | | 140 | 35 | 50 | 5 |

## 10.4 තෙත් කලාපය සඳහා වර්ෂා පෝෂිත තත්ත්ව යටතේ වී වගාවට අවශ්‍ය පෝෂක ප්‍රමාණ හා පොහොර නිර්දේශය

තෙත් කලාපය සඳහා වර්ෂා ජලයෙන් වී වගා කිරිමේදී අවශ්‍ය පෝෂක ප්‍රමාණයන් වගු අංක 10න් දැක්වේ. උපරිම කාර්යක්ෂමතාවයක් සඳහා විවිධ වයස් කාණ්ඩවල වී වර්ගවලට ලබා දිය යුතු පොහොර ප්‍රමාණයන් හා කාල සීමාවන් වගු අංක 11න් දැක්වේ.

*වගුව 10. තෙත් කලාපයේ වර්ෂා ජලයෙන් පමණක් වී වගා කිරීමේදි නිර්දේශිත පෝෂක ප්‍රමාණයන් (හෙක්ටයාර් එකකට කිලෝ ග්‍රෑම්)*

| **නයිට්‍රජන්** (N) | **පොස්පරස් පෙන්ටොක්සයිඩ්** ($P_2O_5$) | **පොටෑසියම් ඔක්සයිඩ්** ($K_2O$) | **සින්ක්** (Zn) |
|---|---|---|---|
| 45 | 25 | 65 | 1 |

*වගුව 11. තෙත් කලාපයේ වර්ෂා පෝෂිත තත්ත්ව යටතේ වී වගා කිරීමේදී විවිධ වයස් කාණ්ඩවල වී වර්ග සඳහා ලබා දිය යුතු පොහොර ප්‍රමාණයන් හා කාල සීමාවන්.*

| **වී වර්ගය** | **යොදන කාලය (සිටුවීමට හෝ වැපිරීමට පසු)** | **පොහොර වර්ගය හා ප්‍රමාණය (හෙක්ටයාර එකකට කිලෝ ග්‍රෑම්)** | | | |
|---|---|---|---|---|---|
| | | **යූරියා** | **ටී.එස්.පී.** | **එම්.ඕ.පී.** | **සින්ක් සල්ෆේට්** |
| මාස 3 වී වර්ග සඳහා | මූලික | | 55 | | 5 |
| | සති 2 | 25 | | 35 | |
| | සති 4 | 30 | | 45 | |
| | සති 6 | 25 | | 30 | |
| | සති 7 | 20 | | | |
| එකතුව | | 100 | 55 | 110 | 5 |
| මාස 3 1/2 වී වර්ග සඳහා | මූලික | | 55 | | 5 |
| | සති 2 | 25 | | 35 | |
| | සති 4 | 30 | | 45 | |
| | සති 6 | 25 | | 30 | |
| | සති 8 | 20 | | | |
| එකතුව | | 100 | 55 | 110 | 5 |
| මාස 4 වී වර්ග සඳහා | මූලික | | 55 | | 5 |
| | සති 2 | 25 | | 35 | |
| | සති 4 | 30 | | 45 | |
| | සති 7 | 25 | | 30 | |
| | සති 9 | 20 | | | |
| එකතුව | | 100 | 55 | 110 | 5 |

## 11. පොහොර භාවිතය තවදුරටත් කාර්යක්ෂම කිරීමට හා වැඩි අස්වැන්නක් සඳහා ගොවි ජනතාවට උපදෙස්

ඉහත පොහොර නිර්දේශවලින් හඳුන්වාදී ඇත්තේ එක සමාන පාංශු හා දේශගුණික ලක්ෂණ සහිත ප්‍රදේශ සමස්ථයක් වශයෙන් ගත්විට ලබා දිය යුතු පෝෂක මට්ටම් හා රසායනික පොහොර ප්‍රමාණයන්ය. මෙම පොහොර නිර්දේශය පොහොර අවශ්‍යතාවය පිළිබඳ මගපෙන්වීමක් වන අතර පොහොර අවම මට්ටමෙන් භාවිතාකොට තවදුරටත් උපරිම අස්වැන්නක් ලබා ගැනීම සඳහා ඒ ඒ ස්ථානවල පස් හා ශාක විශ්ලේෂණයක් සිදුකර අවශ්‍ය පෝෂක වර්ග හා ප්‍රමාණයන් හඳුනාගෙන ස්ථානීය පොහොර නිර්දේශයන් ලබා ගැනීම යෝග්‍යය. පස් විශ්ලේෂණයක් මගින් වී වගාවට බලපාන පසේ අනෙකුත් ප්‍රශ්ණ පවා හඳුනාගත හැකි වන හෙයින් වැඩි අස්වැන්නක් ලබාගැනීම සඳහා පස් විශ්ලේෂණයක් සිදුකර ගැනීමට ගොවි මහතුන් උනන්දු විය යුතුය. එමෙන්ම නියමිත කාලයට නියමිත උපකරණ භාවිතා කරමින් බිම් සකස් කිරීම, වී වගාවේදී මනා ජල පාලනය, වල් මර්ධනය, රෝග හා පළිබෝධ පාලනය මනා ලෙස සිදු කිරීම පොහොරවලින් උපරිම කාර්යක්ෂමතාවයක් ලබා ගැනීමටත් වී වගාවෙන් වැඩි අස්වැන්නක් ලබා ගැනීමටත් අත්‍යවශ්‍යය කරුණු වේ. තවදුරටත් පොහොර භාවිතයේ කාර්යක්ෂමතාවය ඉහල නැංවීම සඳහා විවිධ පාංශු තත්ත්වයන්ට නිර්දේශිත වී වර්ග හා ගුණාත්මක බිත්තර වී භාවිතයට ගොවීන් පුරුදු විය යුතුය. මේ මඟින් ශ්‍රී ලංකාව තවදුරටත් ස්ව්‍යංපෝෂිත තත්ත්වයේ පවත්වාගන්නා අතරම පරිසර හිතකාමී වී වගාවක් පවත්වා ගැනීමට ද හැකිවේ.

## 12. වී වගාව සඳහා පොහොර නිර්දේශ කිරීමට කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල් විසින් පත් කරන ලද කමිටුව

සභාපති - ආචාර්ය ඩබ්. එම්. ඒ. ඩී. බී. වික්‍රමසිංහ මයා, අධ්‍යක්ෂ, ස්වභාවික සම්පත් කළමණාකරණ මධ්‍යස්ථානය, පේරාදෙණිය.

ලේකම් - ඩී. එන්. සිරිසේන මයා, පර්යේෂණ නිළධාරී, වී පර්යේෂණ හා සංවර්ධන ආයතනය, බතලගොඩ, ඉබ්බාගමුව.

සාමාජිකයන් - ආචාර්ය ප්‍රියන්ත වීරසිංහ මයා, පර්යේෂණ නිළධාරී, උද්‍යාන බෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනය, ගන්නොරුව, පේරාදෙණිය.

කේ. එම්. ඒ. කැන්දරාගම මයා, පර්යේෂණ නිළධාරී, ස්වභාවික සම්පත් කළමණාකරණ මධ්‍යස්ථානය, පේරාදෙණිය.

ආචාර්ය ආර්. එස්. කීර්තිසේන මයා, පර්යේෂණ නිළධාරී, වී පර්යේෂණ හා සංවර්ධන ආයතනය, බතලගොඩ, ඉබ්බාගමුව.

ආචාර්ය ඩබ්. එම්. ජේ. බණ්ඩාර මයා, නියෝජ්‍ය අධ්‍යක්ෂ පර්යේෂණ, ප්‍රාදේශීය කෘෂිකර්ම පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය, ගෝනවිල, මාකඳුර.

ආචාර්ය ජේ. බී. ඩී. එස්. කහඳවල මයා, නියෝජ්‍ය අධ්‍යක්ෂ පර්යේෂණ, ප්‍රාදේශීය වී පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය, බෝඹුවල.

ජේ. ආර්. සුදසිංහ මයා, සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ (වී), ව්‍යාප්ති හා පුහුණු අංශය, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, පේරාදෙණිය

# ස්තූතිය

මෙම පොත මුද්‍රණය කිරීම සඳහා සහ පොලොන්නරුව, කුරුණෑගල, කළුතර හා හම්බන්තොට යන දිස්ත්‍රික්කවල ගොවි ක්ෂේත්‍ර තුල පොහොර භාවිතය කාර්යක්ෂම කිරීමේ ආදර්ශන සඳහා මූල්‍යමය ආධාර ලබා දීම වෙනුවෙන් NARP වැඩසටහනේ සම්බන්ධීකරන නිළධාරීන්ට හා CARP ආයතනයේ සභාපතිතුමා ඇතුළු සියලුම නිළධාරීන්ට

ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් ශ්‍රී ලංකාවේ වී වගාවේ අස්වනු පිලිබඳ දත්ත ලබාදීම වෙනුවෙන් ජන හා සංඛ්‍යා ලේඛණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්තුමා, කෘෂිකර්ම හා පාරිසරික සංඛ්‍යා ලේඛණ අංශයේ අධ්‍යක්ෂකතුමා සහ ජ්‍යෙෂ්ඨ සංඛ්‍යා ලේඛණඥ ජයසම්පත් ලියනගේ මහතා ඇතුලු කාර්යය මණ්ඩලයට

NARP ව්‍යාපෘතිය යටතේ ක්ෂේත්‍ර කටයුතුවලට දායක වූ වී පර්යේෂණ හා සංවර්ධන ආයතනයට අයත් බතලගොඩ, බෝඹුවල හා අම්බලන්තොට පර්යේෂණ ස්ථානවල අධ්‍යක්ෂ, අතිරේක අධ්‍යක්ෂ, නියෝජ්‍ය අධ්‍යක්ෂ හා අනෙකුත් සියලුම නිළධාරීන්ට

වී වගාව සඳහා නව පොහොර නිර්දේශයක් හඳුන්වා දීමට අපව දිරි ගැන්වූ කෘෂිකර්ම අමාත්‍යාංශයේ ලේකම්, අතිරේක ලේකම් හා කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල්තුමා ඇතුළු කෘෂිකර්ම අමාත්‍යාංශයේ හා කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ මණ්ඩලය ඇතුළු සියලුම නිළධාරින්ට

මෙම පොත් පිංච සකස්කිරීමේ කටයුතු නොපිරිහෙලා ඉටුකරදුන් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ශ්‍රව්‍ය දෘෂ්‍ය මධ්‍යස්ථානයේ අතිරේක අධ්‍යක්ෂතුමා ඇතුළු කාර්ය මණ්ඩලයට

මෙම පොත් පිංචෙහි මුද්‍රණ කටයුතු ඉතා ඉක්මනින් හා ආකර්ශණීය ආකාරයෙන් ඉටුකරදුන් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ මුද්‍රණාලයේ අතිරේක අධ්‍යක්ෂතුමා ඇතුළු සියලුම නිලධාරින්ට

මෙම කටයුත්ත සඳහා අතහිත දුන් සියළුම දෙනාට